# ෆේටා සහ නැතිවුණු ප්‍රහේලිකා



ටී. එන්. මතීෂ දසනායක

# මෙිටා සහ නැතිවුණු ප්‍රහේලිකා


## ටී. එන්. මතීෂ දසනායක

කතෘ

ධර්මරාජ විද්‍යාලය - මහනුවර

6 ශ්‍රේණිය B


2026


ප්‍රකාශිත දිනය 2026-05-10

**ISBN 978-624-211-492-7**

# ~ පිදුම ~

මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමිය වන ශශිකලා සේනාධීර මියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් සර්ටත්, මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිතුමා, මධ්‍යම අංශයේ විදුහල්පතිතුමා 6-B පංතියේ පංතිභාර ගුරුතුමියටත්, අංශභාර ගුරුතුමියටත් මෙම අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව මගපෙන්වීමත් වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය.

මා ඉගනගත් ධර්මරාජ විද්‍යාලයේ අකුරු කියාදුන් සියලුම ගුරුවරුන්ට යහළුවන්ට මේ කුඩා උත්සාහයට ආදරයෙන් පිදේ..



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා
විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව



ඈත කාලෙක, ගස් උසට නැගෙන, ගඟක් මැදින් ගලා යන ලස්සන වනාන්තරේක මේටා කියන පුංචි නරියෙක් හිටියා. මේටා අනිත් නරියන් වගේ නෙවෙයි. එයාට තිබුණේ පාට පාට, දිලිසෙන ඇස් දෙකක්. ඒ ඇස් දිහා බැලුවම පේනවා එයාගේ හිත ඇතුළේ තියෙන කුතුහලය. මේටාට තිබුණු විශේෂම බලය තමයි, එයාට ඕනෙම ප්‍රශ්නෙකට උත්තර හොයන්න පුළුවන් වීම. වනේ ඉන්න හැම සතෙක්ම දැනන් හිටියා, අමාරු ප්‍රශ්නයක් ආවොත් මේටා ගාවට යන්න ඕනේ කියලා.



එක උණුසුම් උදෑසනක, වනේ හිටපු සත්තු ඔක්කොම එකතුවෙලා මේටාගේ ගෙදරට ආවා. පළවෙනියට ආවේ වේගයෙන් දුවන හාවා. එයාගේ කන් දෙකත් බයක් නිසා වෙව්ලමින් තිබුණා. එයා කියන්න පටන් ගත්තා:

"මේටා, ලොකු අමාරුවක්! අපේ වනේ තියෙන පරණ ප්‍රහේලිකා පොත නැතිවෙලා! ඒ පොත නැතුව හෙට තියෙන ලොකු උත්සවේ පටන් ගන්න බෑ. ඒ පොත තමයි අපේ වනේ ඉතිහාසය, අපේ සීයලා මීට කලින් ඇහුව ප්‍රහේලිකා හැමදේම තියෙන්නේ."



මේටා එයාගේ දිලිසෙන ඇස් දෙක වටේ කරකවලා හැමෝ දිහාම බැලුවා. අලි මහත්තයා, වඳුරා, ගිරවා, කැස්බෑ මහත්තයා, ඔක්කොම බලාගෙන ඉන්නවා බලාපොරොත්තුවෙන්. මේටා සන්සුන්ව කියන්න ගත්තා:

“බය වෙන්න එපා. අපි හොයමු. ප්‍රහේලිකා පොත කොහේ හරි ඉන්නවා. අපිට කරන්න තියෙන්නේ, ඒක තියෙන තැනට යන පාරේ ඉඟි හොයන එක.”

පළවෙනි වැඩේ විදිහට මේටා ගියා අලි මහත්තයා ගාවට. අලි මහත්තයා තමයි වනේ වැඩිම වයසම සතා.



"අලි මහත්තයෝ, ඔයා අන්තිමට ප්‍රහේලිකා පොත දැක්කේ කොහේද? හොඳට මතක් කරලා කියන්න."

අලි මහත්තයා එයාගේ දිග හොඬවැලෙන් නිකට අතගා හිතුවා.

"ඊයේ හවස, මම ගඟ ළඟට ගිහින් වතුර බොද්දි, පොත ගඟ අයිනේ ලොකු ගලක් උඩ තිබුණා. ඊටපස්සේ මම ගෙදර ආවා."

ඒ තොරතුර ලැබුණ ගමන් මෙටා ගඟ පැත්තට දිව්වා. ගඟ ළඟට ගිහින් එයා හොයන්න පටන් ගත්තා. ටික වෙලාවක් හොයද්දි එයාට හම්බුණා තෙත් වෙච්ච කොළයක්. ඒ කොළේ දාර ටික ඉරිලත් තිබුණා. ඒ කොළේ උඩ ලස්සනට ලියලා තිබුණා ප්‍රහේලිකාවක්:

“මට පියාපත් නැහැ, ඒත් මම පියාසර කරනවා. මට කකුල් නැහැ, ඒත් මම ඇවිදිනවා. මට ඇස් නැහැ, ඒත් මම අඬනවා. මම කවුද?”



මේටා ඒක කියවලා හිනා වුණා. “අනේ මේක නම් හරිම ලේසියි! මේකේ උත්තරේ තමයි වලාකුළක්! වලාකුළට පියාපත් නැහැ, ඒත් සුළඟත් එක්ක එයා පියාසර කරනවා. එයාට කකුල් නැහැ, ඒත් එයා අහස පුරා ඇවිදිනවා. එයාට ඇස් නැහැ, ඒත් වහිනකොට එයා අඬනවා!”



මේටා දැනගත්තා මේක තමයි පළවෙනි ඉඟිය කියලා. ඒ කියන්නේ ප්‍රහේලිකා පොත ගත්ත කෙනා, මේ වගේ ප්‍රහේලිකා ගමන පුරාම දාලා තියෙනවා.

ඊටපස්සේ මේටා ඇවිදගෙන ගියා ගහක් උඩ තියෙනවා කැඩපතක් වගේ දෙයක් දිහා. ඒක තිබුණේ උස ගසක අත්තක එල්ලලා. මේටා උඩට පැනලා ඒක අරන් බැලුවා. ඒකත් තිබුණේ තව ප්‍රහේලිකාවක්:

“ම කෑවත් මම බඩගිනියි. මම බීවත් මම මැරෙනවා. මට වර්ණ ගොඩක් තියෙනවා, ඒත් මම කළුයි. මම කවුද?”

මේටා ටිකක් හිතුවා. ඊටපස්සේ එයා කෑගැහුවා:
“ඒක ගින්දර! ගින්දර දර කෑවත් එයාට බඩගිනියි. එයාට වතුර බිව්වොත් එයා මැරෙනවා. ගින්දරට නිල්, රතු, කහ වර්ණ තියෙනවා, ඒත් ගින්දර නිවුණාම ඉතුරු වෙන්නේ කළු අඟුරු!”

දෙවෙනි ඉඟියත් හොයාගත්තාම, මේටාට තේරුණා ප්‍රහේලිකා පොත ගත්ත කෙනා වනේ උසම ගහ ගාව ඉන්නවා ඇති කියලා.

මේටා තව දුර ගියා. එයා ගියා ගුරුලු මහත්තයාගේ ගෙදර පැත්තට. ගුරුලු මහත්තයා තමයි වනේ ඉන්න දක්ෂම කියවන සතා. ගුරුලු මහත්තයාගේ ගෙදර ළඟට වෙද්දි මේටාට ඇහුණා කියවන සද්දයක්.



ඇතුළට ගියාම මේටා දැක්කා ගුරුලු මහත්තයා එයාගේ කූඩුව ඇතුළේ වාඩි වෙලා, අතේ තියෙනවා ඒ නැතිවුණු ප්‍රහේලිකා පොත!

“ගුරුලු මහත්තයෝ!” මේටා පුදුමෙන් කෑගැහුවා.

ගුරුලු මහත්තයා වයස නිසා ටිකක් බය වෙලා කිව්වා:

“මේටා, මම හිතුවේ මම මේ පොත ගත්තොත් කාටවත් කරදරයක් නැහැ කියලා. මට ඕනේ වුණේ හෙට උත්සවේට කලින් මේ ප්‍රහේලිකා ඔක්කොම ආයෙත් කියවන්න. මම ඒවා ගොඩක් ආසයි.”

මේටා හිනා වෙලා කිව්වා:
“ගුරුළු මහත්තයෝ, ඔයා වරදක් කළේ නැහැ. ඒත් ඔයා පොත අරන් ගියා කියලා කාටවත් කිව්වේ නැති නිසා හැමෝම බය වුණා. ඊළඟ පාර කාගෙන් හරි අහුවා නම් හරි.”

මේටා ප්‍රහේලිකා පොත අරන් ගිහින් හැමෝටම පෙන්නුවා. ඔක්කොම සත්තු ගොඩක් සතුටු වුණා.

අලි මහත්තයා කිව්වා: “මේටා, ඔයා නැතුව අපි මේ පොත හොයාගන්නෙම නැහැ.”
හාවා කිව්වා: “මේටා, ඔයා තමයි වනේ ඉන්න දක්ෂම සතා!”



එදා ඉඳන්, මේටා කියන්නේ වනේ ඉන්න හැම ප්‍රශ්නෙකටම උත්තර දෙන, හැමෝටම උදව් කරන දක්ෂම නරියා. එයාගේ දිලිසෙන ඇස් වල තියෙන කුතුහලය නිසා, වනේ තියෙන කිසිම රහසක් සැඟවිලා ඉන්න එකක් නැහැ.

අපිත් අපේ බඩු පරිස්සමට තියන්න ඕනේ.

වැරදුනොත් නිවැරදි කරගන්න එක තමයි ධෛර්ය.

හොඳ යාළුවෝ ඉන්න එක වාසනාවක්*

හාවා උදව් කරලා පොත හොයන්න ආවා. අපිටත් අමාරු වෙලාවක උදව් කරන යාළුවෝ ඉන්න එක ලොකු දෙයක්.

පරිස්සම, වගකීම, යාළු උදව් යන මේ තුන තමයි කතාවෙන් අපිට ලැබෙන පාඩම.

නිමි



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN 978-624-211-492-7**